| 6 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව I,II | කාලය පැය 02යි. |
|---|---|---|

නම/විභාග අංකයඃ- ..............................................................

## I කොටස

- සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා වන ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්ක අයත් පළාත වන්නේ මින් කුමක් ද?
   i. මධ්‍යම පළාත
   ii. උතුරු මැද පළාත
   iii. ඌව පළාත
   iv. දකුණු පළාත

2. උතුරු දිශාව හා නැගෙනහිර දිශාව අතර ඇති දිශාව වන්නේ,
   i. වයඹ
   ii. ඊසාන
   iii. නිරිත
   iv. ගිනිකොණ

3. අවුරුද්දේ එක් කාලයකට පමණක් දක්නට ලැබෙන සංචාරක පක්ෂීන් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
   i. කොහා, ගිරවා, ඇටි කුකුළා
   ii. කොහා, සිවුරු හොරා, වවුලා
   iii. සිවුරු හොරා, ගිරවා, කපුටා
   iv. සිවුරු හොරා, අවිච්චියා, සුදු රෙදි හොරා

4. අම්බලන්ගොඩ නගරය ප්‍රසිද්ධියක් උසුලන්නේ පහත සඳහන් කුමන කර්මාන්තයට ද?

   i. වෙස්මුහුණු  iii. ලී බඩු
   ii. වේවැල් භාණ්ඩ  iv. පැදුරු

5. අවිධිමත් භූමි පරිහරණයට නිදසුනක් නො වන්නේ මින් කුමක් ද?

   i. කඳු බෑවුම්වල වගා කිරීම.
   ii. ආවරණ බෝග වැවීම.
   iii. හුණුගල් කැඩීම.
   iv. ගංගාවලින් අසීමිත ලෙස වැලි ගොඩ දැමීම.

- **අංක 5 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

6. උෂ්ණත්වය මැනීම සඳහා ........................................ භාවිතා කරයි.

7. ශාක මගින් වායුගෝලයට ජල වාෂ්ප එකතු වීම ........................................, නමින් හඳුන්වයි.

8. රාමසාන් යනු ........................................ ආගමික උත්සවයකි.

9. කැළණි ගං මිටියාවතේ ........................................ බහුල ව වගා කරනු ලබයි.

10. වගාවන් සඳහා බෑවුම් ප්‍රදේශ යොදා ගැනීම නිසා ........................................ සිදුවිය හැක.

(වාෂ්පීකරණය/ උෂ්ණත්වමානය/ නායයාම්/ ක්‍රිස්තියානි/ ඉස්ලාම්/ උත්ස්වේදනය/ පලා වර්ග / බඩ ඉරිඟු)

- **ප්‍රශ්න අංක 10 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

11. යම්කිසි ස්ථානයක කෙටි කාලයක් තුළ පවතින වායුගෝලයේ ස්වභාවය කාලගුණය ලෙස හැඳින්වේ. (.......................)

12. රබර්, ගංගා නිම්න ප්‍රදේශවල බහුල ව වගා කරන බෝගයකි. (.......................)

13. ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්ප ඥානය පදනම් කර ගත් කර්මාන්ත දක්නට නොලැබේ. (.......................)

14. රාජ්‍ය ඔසුසල මගින් සහනදායි මිලට ඖෂධ ලබා දීම සේවා කර්මාන්තයට නිදසුනකි. (.......................)

15. පරිසරයේ ඇති සම්පත් භාවිතයට ගැනීමේ දී පරිසරයට විවිධ වෙනස්කම් සිදුවිය හැක. (.......................)


- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවල ඉඟි වැකි උපයෝගී කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.**

**හරහට**

16. සුළඟේ වේගය මැනීම සඳහා මෙම උපකරණය භාවිතා කරයි.
17. මාස 12ක කාලය මෙනමින් හැඳින්වේ.
18. මැණික් සඳහා ප්‍රසිද්ධියක් උසුලන සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්කයකි.

**පහළට**

19. ශ්‍රී ලංකාවේ පැරණි රාජධානියක් වූ උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්කයකි.
20. නිවැරදි ව දිශාව හඳුනා ගැනීම සඳහා මෙම උපකරණය භාවිතා කරයි.




(2 X 20 = 40)

## 6 ශ්‍රේණිය - භූගෝල විද්‍යාව

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්කයක් දක්වෙන අක්ෂරය ලියන්න.

   ii. නැගෙනහිර පළාතට අයත් ත්‍රිකුණාමල ස්වභාවික වරාය පිහිටි දිස්ත්‍රික්කය කහ පැහැයෙන් වර්ණ කරන්න.

   iii. පැදුරු නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධියක් උසුලන දුම්බර ප්‍රදේශය දක්වෙන අක්ෂරය ලියන්න.

   iv. ඔබ පාසල අයත් වන පළාතට මායිම් වන පළාත් දෙකක් සිතියමේ නම් කරන්න.

   v. ශ්‍රී ලංකාවේ අග නගරය දක්වෙන දිස්ත්‍රික්කය කොළ වර්ණයෙන් සේයා කරන්න.

   vi. ලී බඩු නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශය දක්වෙන අක්ෂරය නම් කරන්න. (2x6=ලකුණු 12)

2. i. ශාකවලින්,

   a) මිනිසාට

   b) සතුන්ට

   c) පරිසරයට

   ලැබෙන ප්‍රයෝජන එක බැගින් ලියන්න. (ල.3)

   ii. පහත දක්වෙන සතුන්ගෙන් පරිසරයට ලැබෙන ප්‍රයෝජනය බැගින් ලියා දක්වන්න.

   * වේයා ..............................
   * බත්කූරා ..............................
   * ගිරවා ..............................
   * ගැඩවිලා ..............................


   (ල.4)

iii. ඔබ නිවස අවට පිහිටි ප්‍රදේශයේ ජීවත්වන ජන වර්ග හා ඔවුන් අදහන ආගම් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ජන වර්ගය | ආගම් | උත්සව |
|---|---|---|
| සිංහල | ............................ | ............................ |
| ............................ | ඉස්ලාම් | ............................ |
| දෙමළ | ............................ | තෛපොංගල් |

(ල.5)

3. පහත දැක්වෙන්නේ කාලගුණික අංග මැනීම සඳහා භාවිතා කරන උපකරණ 3කි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. ඉහත A,B හා C උපකරණ නම් කරන්න. (ල.3)

ii. ඉහත A හා B උපකරණ මගින් මනිනු ලබන කාලගුණික අංග දෙක සඳහන් කරන්න. (ල.4)

iii. කාලගුණික තොරතුරු කල් තබා දැන ගැනීමෙන් ලැබෙන වාසි 2 ක් කෙටියෙන් පහදන්න. (ල.5)

4\. i. කෘෂිකාර්මික භූමි පරිභෝගය යටතේ ගැනෙන ප්‍රධාන අංශ තුන සඳහන් කරන්න. (ල.3)

ii. ඔබට පොදු සේවා සපයන ආයතන 4ක් ලියා දක්වන්න. (ල.4)

iii. A හා B ගැළපෙන සේ යා කරන්න.

| A | B |
|---|---|
| තැනිතලා ප්‍රදේශය | මිදි වගාව |
| ගංගා නිම්න ප්‍රදේශය | බඩ ඉරිඟු වගාව |
| කඳුකර ප්‍රදේශය | පොල් වගාව |
| උතුරු ප්‍රදේශය | පලා වගාව |
| වියළි ප්‍රදේශය | තේ රබර් වගාව |
| | වී වගාව |

(ල.5)

5\. i. පාසල අවට පිහිටි ස්වභාවික භූගෝලීය ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල.3)

ii. ග්‍රාමීය පරිසරයක හා නාගරික පරිසරයක දක්නට ලැබෙන වෙනස්කම් දෙක බැගින් ලියන්න. (ල.4)

iii. පාසල අවට භූමියේ දක්නට ලැබෙන පහත සඳහන් භූගෝලීය ලක්ෂණ කැමති පිළිවෙළකට චිත්‍රයට හා කටු සිතියමකට නගන්න.

- පාසල • ප්‍රධාන මාර්ගය • ගංගාව • නිවාස • ගුරු පාර

උ ↑

චිත්‍රය | කටු සිතියම (ල.5)

6\. i. ඔබ නිවස අවට වටපිටාවේ භූමිය ප්‍රයෝජනයට ගෙන ඇති විවිධ අවස්ථා තුනක් ලියා දක්වන්න. (ල.3)

ii. අවිධිමත් ලෙස භූමිය පරිහරණය කරන අවස්ථා 2 ක් සඳහන් කරන්න. (ල.4)

iii. පාසල් සිසුවෙකු වශයෙන් භූමිය විධිමත් ව පරිහරණය කිරීම සඳහා ඔබට දායක විය හැකි අවස්ථා 2 ක් දක්වන්න. (ල.5)

2. පත්‍රයේ පළමුවන ප්‍රශ්නය සඳහා අදාල සිතියම

